# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 339/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 25/02/2024<br>පැය1405 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**10. මාරක රිය අනතුරක් - වැල්ලවාය පොලිස් වසම.**

2024.02.25 වන දින උදෑසන කාලයේ වැල්ලවාය පොලිස් වසමේ වැල්ලවාය මොණරාගල මාර්ගයේ මල්ලත්තාවල හංදිය අසල දී මොණරාගල දෙස සිට වැල්ලවාය දෙසට ධාවනය වූ යතුරු පැදියක් එම දිසාවටම ඉදිරියෙන් ගමන් ගත් ලොරි රථයක පිටුපස ගැටී මාර්ගයේ පෙරළී ගොස් විරුද්ධ දිසාවෙන් පැමිණි ලොරි රථයක ගැටී අනතුරක් සිදු වී ඇත.අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදියේ පැදිකරු හා පසු පැදිකාරිය වැල්ලවාය රෝහලට ඇතුලත් කිරීමේදී පසුපැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 47ක් වූ පිල්ලවල බුත්තල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මෘත ශරීරය වැල්ලවාය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වැල්ලවාය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. වන අලියකු පහර දීමෙන් කාන්තාවක් මිය යාමක් - වැලිකන්ද පොලිස් වසම.**

2024.02.25 වන දින අලුයම් කාලයේදී වැලිකන්ද පොලිස් වසමේ මුතුවැල්ල ප්‍රදේශයේ කුඹුරු ඉඩමක වන අලියකු පහර දීමෙන් කාන්තාවක් මිය ගොස් ඇති බවට වැලිකන්ද පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත .

**මරණකාරිය වයස අවුරුදු 41 ක් වන මුතුවැල්ල, වැලිකන්ද ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය තම සැමියා හා පුතා සමඟ වන සතුන්ගෙන් කුඹුරු ඉඩම ආරක්ෂා කර ගැනීම සඳහා සාදන ලද පැලක් තුල සිට ඇති අතර අලුයම් කාලයේදී පැමිණි වන අලියෙකු විසින් කාන්තාවට පහර දී එම පැලටද හානී සිදු කර ඇත. සිදුවීමෙන් පියා සහ පුතාද සුළු තුවාල ලබා ඇති අතර වැලිකන්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.
.

## 11. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ විමර්ශන කොට්ඨාසය.

2024.02.24 වන දින දහවල් කාලයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ සංවිධානාත්මක අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මරදාන පොලිස් වසමේ ලෝකට්ලේන් පාලම අසලදී වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 377 ක්** සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධව සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී මරදාන පොලිස් වසමේ නිවසක් බිඳ පවුම් 09ක් පමණ වටිනා රන් භාණ්ඩ හා අත්ඔරලෝසුවක් සොරකම් කර ඇති බවට අණාවරනය වී ඇති අතර සොරා ගන්නා ලද රන් භාණ්ඩ හා අත් ඔරලෝසුව සොයා ගෙන ඇත.

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**